විෂය - නර්තනය

ශ්‍රේණිය - 7 ශ්‍රේණිය

නිපුණතාවය 4.0 - ශ්‍රී ලාංකිය සංස්කෘතිය හා සබැඳි ගායනා වල පසුබිම අධ්‍යනය කරමින් ගායන කුසලතා ප්‍රදර්ශනය කරයි.

නිපුණතා මට්ටම 4.2 - නියමිත තිත් රූප හා නාදමාලා අනුගමනය කරමින් ගායන ඉදිරිපත් කරයි.

❖ පෙර ක්‍රියාකාරකම - ඔබ දන්නා කුලු කවියක් තාල තබා ගායනා කරන්න.

❖ ක්‍රියාකාරකම - ජනතාව අතර දීර්ඝ කාලයක් තිස්සේ භාවිතා වීමෙන්

ජන කවි ගැමියාගේ පොදු අයිතියක් බවට පත්ව ඇත. ජීවිතයේ කාන්සිය පාලුව සහ විඩාව දුරු කර ගැනීම ට හා විනෝදාස්වාදයක් සඳහා මේවා නිර්මාණය වී ඇත.කමතේ දී හා මුලුතැන්ගෙයි දී කුල්ල භාවිතා කර -මින් පහත ක්‍රියාකාරකම් සිදුකර ඇත.

- කුල්ලෙන් කරනු ලබන කාර්යයන් - අස්වැන්න හෙවත් බැත පිරිසිදු කරගැනීමට
  - -කාටුව පිස හැරීමට
  - -බැත හුලං කිරීමට
  - -මුලුතැන්ගෙයි කටයුතු සඳහා

❖ මෙයට පූජා භාණ්ඩයක් ලෙස සලකා බැත ගොඩ මතින් තබා නමස්කාර කර කාර්යයන් සඳහ යොදා ගනී.

❖ යොදා කව් ගායනා සරල බස් වහරකින් යුතු වීම.
❖ කුලු නැටුම සඳහා රත්නමාලි දෙව්දුව සම්බන්ධ රන් තෙළඹු වර්ණනාවේ එන කවි හා රත්නවල්ලි කවි යොදා ගනී.
❖ කුල්ල රටා දමා ඇති බව ගායනාවලින් ද කියවේ.
❖ මෙම නැටුමේ රංග රටා හැඩතල භාවිතයෙන් සුන්දරත්වය විදහපායි.



ඈත සිටන් එන්නී සෙල්ලි සෙල්ලි යේ

මෑත සිටන් එන්නී සෙල්ලි සෙල්ලි යේ
අතේ පයේ ගිගිරිද සෙල්ලි සෙල්ලි යේ
කුලු සරඹෙට එනවද රත්නවල්ලි යේ

බන්දවාන කුලු යතුරු තනා ලා
කැන්දවාන සදෙනෙකුට කියා ලා
ඇන්දවාන අලු යන්තරෙ ඇඳ ලා
කන්දෙ බැඳෙන බැත පැහැපත් කර ලා

❖ පසු වැඩ පැවරුම

ඉහත ගායනා තාල තබා ගායනා කරන්න.

( යූ . බී . චතුරාණි නවරත්න -ර/නෙල්ලිවල විද්‍යාලය)